## පළමුවන දේව ප්‍රකාශනය

ජෙරමියා 31:31-34

ජෙරමියා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**("මම ඔවුන්ගේ පව් අමතක කොට ඔවුන් හා නව ගිවිසුමක් කරන්නෙමි.")**

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක. "ඉශ්රායෙල් සෙනඟ හා ජුදා සෙනඟ සමඟ ද මා අලුත් ගිවිසුමක් කරන කාලය පැමිණෙන්නේ ය. ඒ වනාහි ඔවුන්ගේ පියවරුන් මා අතින් අල්ලාගෙන මිසර දේශයෙන් පිටතට ගෙන එන්නට පියවර ගත් කාලයේ දී ඔවුන් සමඟ මා කළ ගිවිසුම ඔව්හු කඩ කළෝ ය. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය. එහෙත්, ඒ කාලය පැමිණි විට, ඉශ්රායෙල් සෙනඟ සමඟ මා කරන ගිවිසුම මෙය වේ. මම මාගේ අණපණත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි. මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි, ඔව්හු මාගේ සෙනඟ වන්නෝ ය. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය. 'සමිඳාණන් වහන්සේ හඳුනාගන්න' කියා, එකිනෙකා තම තමාගේ අසල්වැසියාට ද සහෝදරයාට ද උගන්වන්නට වුවමනා වන්නේ නැත. මන්ද, ඔවුන්ගෙන් කුඩා අය පටන් ලොකු අය දක්වා සියල්ලන් ම මා හැඳින ගනු ඇත. මම ඔවුන්ගේ අපරාධ කමා කරන්නෙමි; ඔවුන්ගේ පාප තවත් සිහි නොකරන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය."

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 51:1-2, 10-13

පිළිතුර: දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව.

ගීය: දෙවිඳුනී, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව. ඔබේ විපුල දයාවෙන් මාගේ අපරාධ මකා දමුව මැනව. මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව. මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.

දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව; තිරසර නව ආධ්‍යාත්මයක් මට දුන මැනව. ඔබ හමුයෙන් මා පලවා නොහැරිය මැනව; ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව.

විමුක්තියේ ප්‍රීතිය මට යළි දුන මැනව. අවනත සිතක් දී මා දරුව මැනව. එවිට මම අපරාධකරුවන්ට ඔබ මඟ පහදා දෙන්නෙමි. පව්කරුවන් ඔබ වෙත හරවා ගෙන එන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය

හෙබ්‍රෙව් 5:7-9

හෙබ්‍රෙව්වරුන්ට වෙත යැවූ හසුනෙන් කොටසකි.

**(පාපය මගින් මරණයට පත් වූ අපව දෙවියන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ සමඟ ජීවත් කර වදාළ සේක.)**

ක්‍රිස්තුන් වහන්සේ මිනිසත්බව ගෙන සිටිය දී තමන් මරණයෙන් ගළවන්නට පිළිවන් වූ තැනැන් වහන්සේට බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙනුත්, යාච්ඤා ද කන්නලවු ද ඔප්පු කළ සේක. උන් වහන්සේගේ දේව ගරුබිය නිසා, දෙවියන් වහන්සේ එයට සවන් දුන් සේක. උන් වහන්සේ පුත්‍රයාණන් වූ නමුත්, තමන්ගේ දුක් විඳීමෙන් කීකරුකම ඉගෙනගත් සේක. මෙසේ උන් වහන්සේ සම්පූර්ණත්වය ලැබ, තමන් වහන්සේට කීකරු වන සියල්ලන්ගේ සදතන විමුක්තිදායකයාණෝ වූ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුපුවත් ජය නද</u>** ජොහන් 12:26

මහිමයත් ප්‍රශංසාවත් ඔබටම වේ ක්‍රිස්තුනී !

"යමෙක් මට සේවය කරන්නේ ද, ඔහු මා අනුගාමී විය යුතු යි. මම යම් තැනෙක සිටිම් ද මාගේ සේවකයා ද එහි ම සිටිනු ඇත" යි ස්වාමින් වහන්සේ වදාළ සේක.

ප්‍රශංසාවත් ගෞරවයත් නිති ඔබටම වේවා ජේසු ස්වාමිනී !

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ජොහන් 12:20-33

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(බීජය පොළොවෙහි වැටී මළොත් එය සරු ලෙස පල දරයි.)**

මංගල්‍යයේ දී නමස්කාර කරන පිණිස ගියවුන් අතර, ග්‍රීකයෝ සමහර දෙනෙක් ද සිටියහ. ඔව්හු, ගලීලයේ බෙත්සයිදාවේ පිලිප් වෙතට පැමිණ, "මහතාණෙනි, අපි ජේසුස් වහන්සේ දකින්නට කැමැත්තෙමු"යි කී හ. පිලිප් එය ඇන්ඩෲට කී ය; ඇන්ඩෲ ද පිලිප් ද ජේසුස් වහන්සේට සැළ කළහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මනුෂ්‍ය–පුත්‍රයාණන් මහිමයට පමුණුවනු ලබන නියමිත මොහොත පැමිණ තිබේ. ඒකාන්තයෙන් ම මම ඔබට කියමි, තිරිඟු බීජය පොළොවෙහි වැටී නොමළොත් එය තනි බීජයක් පමණක් වේ. එහෙත් එය මළොත් සරු ලෙස පල දරයි. තම ජීවිතයට ඇලුම් කරන්නා එය නැති කරගනියි; මෙලොව තම ජීවිතයට ද්වේශ කරන්නා එය සදාතන ජීවනය සඳහා රැකගනියි. යමෙක් මට සේවය කරන්නේ ද, ඔහු මා අනුගාමී විය යුතු යි. මම යම් තැනෙක සිටිම් ද මාගේ සේවකයා ද එහි ම සිටිනු ඇත. යමෙක් මට සේවය කරන්නේ ද මාගේ පියාණෝ ඔහුට ගෞරව කරන සේක. දැන් මාගේ සිත කැළඹී ඇත; ඉදින් මම කුමක් කියම් ද? 'පියාණෙනි, මේ මොහොතෙන් මා ගැළවුව මැනවැ'යි කියම් ද? නැත, මා මේ මොහොතට පැමිණියේ මේ උදෙසා ම ය. පියාණෙනි, ඔබගේ නාමය මහිමයට පැමිණවුව මැනවැ"යි වදාළ සේක. එවිට, "මම එය මහිමයට පැමිණවීමි, යළිත් මහිමයට පමුණුවන්නෙමි"යි ස්වර්ගයෙන් හඬක් නික්මිණි. එහි සිටි සමූහයා එය අසා, "ගිගුරුමකැ"යි කී හ. ඇතැමෙක්, "දේව දූතයෙක් උන් වහන්සේට කතා කෙළේ ය"යි කී හ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මේ හඬ පැමිණියේ මා උදෙසා නොව ඔබ උදෙසා ය. මේ ලෝකය පිළිබඳ විනිශ්චය මොහොත දැන් ය; මේ ලෝකයේ අධිපතියා දැන් පරාජය කරනු ලැබේ. තවද මා පොළොවෙන් ඔසවනු ලැබූ කල, සියල්ලන් මා වෙතට ඇදගන්නෙමි"යි වදාළ සේක. උන් වහන්සේ මෙසේ වදාළේ, තමන් වහන්සේ විඳින්නට යන්නේ කෙබඳු මරණයක් දැ යි හඟවන පිණිස ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.